සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

SLGURU.LK

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2025
ஆண்டிறுதி மதிப்பீடு - 2025
Year End Evaluation - 2025

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 යි |

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

සැලකිය යුතුයි

- I කොටසේ ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- I කොටසේ අංක 01 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලට ම වඩාත් නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

## I කොටස

01) බතාවිය තම වෙළෙඳ මූලස්ථානය බවට පත් කරගත් යුරෝපා ජාතිය පහත පිළිතුරු අතරින් තෝරන්න.
1 ප්‍රංශ 2 ඉංග්‍රීසි 3 ලන්දේසි 4 පෘතුගීසි

02) ලන්දේසි පාලන සමයේ මෙරට සිදු කළ ආර්ථික වෙනස්කම් පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

14036

A කොළඹ, කළුතර, මාතර වැනි ප්‍රදේශවල කුරුඳු වගා කිරීම
B උළු ගඩොල් වැනි කර්මාන්ත දියුණු කිරීම
C නව උසාවි පද්ධතියක් හඳුන්වා දීම
D පවුල්, ඉඩම් හා පාසල් වශයෙන් තෝම්බු වර්ග පිළියෙල කිරීම
1 A,B,C 2 A,B,D 3 B,C,D 4 A,C,D

03) ක්‍රි.ව. 1766 දී තමන්ට වාසිදායක කොන්දේසි මාලාවක් ඉදිරිපත් කරමින් උඩරට පාලකයා සමඟ ගිවිසුමකට එළඹි ලන්දේසි ආණ්ඩුකාරවරයා කවුරුන්ද?
1 බැරන් වැන් එක් 2 කලන් අල්බස්
3 ජොරිස් වැන් ස්පිල්බර්ජන් 4 විලෙම් පැල්ක්

04) ක්‍රි.ව. 1802 සිට බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ගෙනගිය පාලනය කුමන නමකින් හැඳින්වේද?
1 කිරීටයේ පාලනය 2 ද්විත්ව පාලනය
3 මදුරාසි පාලනය 4 වෙළෙඳ සමාගමේ පාලනය

05) බ්‍රිතාන්‍යයන්ට උඩරට රාජ්‍ය යටත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු වූ කරුණක් නොවන්නේ මින් කුමක්ද?
1 පහත රට ඇතිවන ඉංග්‍රීසි විරෝධී කැරලි වලට රජු සහාය දීම
2 කොළඹ හා ත්‍රිකුණාමලය අතර ගොඩබිමින් සබඳතා පැවත්වීම දුෂ්කර වීම
3 ඉංග්‍රීසි පාලන ප්‍රදේශවල සිටි ශ්‍රී ලාංකිකයින් උඩරට රජු තම රජු ලෙස නොපිළිගැනීම
4 බ්‍රිතාන්‍යයන්ට එරෙහිව උඩරට රජවරු ප්‍රංශයින්ගෙන් ආධාර ගනු ඇතැයි ඔවුන් බිය වීම

06) ක්‍රි.ව. 1815 දී ඉංග්‍රීසීන් හා උඩරට රදළ ප්‍රධානීන් අතර ඇති වූ ගිවිසුමේ පස්වන වගන්තියේ සඳහන් වූයේ
1 නායක්කර් වංශිකයින් ට උඩරට සිහසුන් හා සම්බන්ධ අයිතිවාසිකම් අහෝසි කරන බව යි.
2 රදළවරුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන බව යි.
3 බුද්ධාගම හා දේවාගම් ආරක්ෂා කරන බව යි.
4 අංග ඡේදනය වැනි දඬුවම් අහෝසි කරන බව යි.



For Educational Purpose Only

SLGURU.LK

SLGURU.LK

07) ක්‍රි.ව. 1848 නිදහස් සටනේ නායකයන් පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

1 පුරන් අප්පු, කැප්පෙටිපොල නිලමේ　　2 ගොංගාලේ ගොඩ බණ්ඩා, පුරන් අප්පු

3 කැප්පෙටිපොළ නිලමේ, මඩුගල්ලේ දිසාව　　4 මඩුගල්ලේ දිසාව, ගොංගාලේගොඩ බණ්ඩා

08) • ගම්පොල සිංහපිටියේ ප්‍රථම වරට කෝපි වත්තක් ආරම්භ කිරීම

• ගන්නෝරුවේ පෞද්ගලික ඉඩමක කෝපි වත්තක් ආරම්භ කිරීම

ඉහත තොරතුරු වලට අදාල පුද්ගලයින් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1 ජෝර්ජ් බර්ඩ්, එඩ්වඩ් බාන්ස්　　2 ජේම්ස් ටේලර්, එඩ්වඩ් බාන්ස්

3 ජේම්ස් ටේලර්, ජෝර්ජ් වෝල්　　4 ජෝර්ජ් බර්ඩ්, ආතර් ගෝඩන්

09) ඉංග්‍රීසි පාලනය යටතේ මෙරට වතුවගාවේ දියුණුවක් ඇති වීමට බලපෑ ප්‍රතිසංස්කරණය කුමක්ද?

1 මැනිං.　　2 කෲම් මැකලම්.　　3 මැනිං ඩෙවොන්ෂයර්.　　4 කෝල්බෲක්.

10) ඓතිහාසික හා බෞද්ධ ප්‍රවෘත්තීන් ඇතුලත් නාට්‍ය රචනා කොට දේශීය සංස්කෘතියේ අගය මතුකර දැක්වීමට කටයුතු කළ පුද්ගලයා කවුරුන්ද?

1 වලිසිංහ හරිස්චන්ද්‍ර　　2 පියදාස සිරිසේන　　3 ජෝන් ද සිල්වා　　4 ජේම්ස් පීරිස්

11) ඇම්.සී. සිද්දිලෙබ්බෙ මහතාගේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලද පාසලක් වන්නේ මින් කුමක්ද?

1 පරමේශ්වර විද්‍යාලය　　2 සහිරා විද්‍යාලය　　3 ශිවන්ගල විද්‍යාලය　　4 රාමනාදන් විද්‍යාලය

12) එංගලන්තයේ දෙවන චාල්ස් රජු පෘතුගාලයේ කැතරින් කුමරිය විවාහ කර ගැනීමෙන් පසු ඉංග්‍රීසින්ට හිමි වූ වෙළෙඳ මධ්‍යස්ථානය කුමක්ද?

1 බොම්බාය　　2 මදුරාසි　　3 කරිකාල්　　4 පොන්ඩිචේරි

13) මුස්ලිම් ජනතාව වෙනුවෙන් පකිස්ථානය යනුවෙන් රටක් පිහිටුවා ගැනීමට ප්‍රබල ව්‍යාපාරයක් ගෙන ගිය පුද්ගලයා කවුරුන් ද?

1 ස්ටැපර්ඩ් ක්‍රිප්ස්　　2 මවුන්ට් බැටන් සාමි　　3 මොහොමඩ් අලිජින්නා　　4 වින්සන්ට් චර්චිල්

14) ඉන්දියාවේ "සම්භාවනීය මහල්ලා" යන අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලබන්නේ.

1 ජවහල්ලාල් නේරු ය.　　2 බාල් ගංගාධාර් තිලක්.

3 සුරේන්ද්‍රනාත් බැනර්ජි ය.　　4 දඩාබායි නඖරෝජි ය.

15) බ්‍රිතාන්‍ය පාලනය යටතේ මෙරට අවසන් ආණ්ඩුකාරවරයා වශයෙන් කටයුතු කළේ කවුරුන් ද?

1 චාල්ස් හේ කැමරන්　　2 හෙන්රි මන්ක් මේසන් මුවර්　　3 රොබට් බ්‍රවුන්රිග්　　4 තෝමස් මෙට්ලන්ඩ්

16) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ වල යම් වෙනස් කමක් ඇති කර ගැනීම සඳහා මුල් වරට උද්ඝෝෂණයක් ආරම්භ කලේ කවුරුන්ද?

1 ව්‍යවස්ථාදායක සභාවේ නිලලත් සාමාජිකයින්　　2 උගත් ශ්‍රී ලාංකිකයින්

3 කුඩා සංවිධාන කීපයක්　　4 මෙරට සිටි යුරෝපීයයන්

17) ක්‍රි.ව. 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවේ ව්‍යවස්ථාදායකය හැඳින්වූයේ කුමන නමකින්ද?

1 රාජ්‍ය මන්ත්‍රණසභාව　　2 පාර්ලිමේන්තුව

3 ජාතික රාජ්‍ය සභාව　　4 ව්‍යවස්ථාදායක සභාව

18) ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණය මෙන්ම අවසාන අභියාචනාධිකරණය වන්නේ

1 ශ්‍රේෂ්ඨාධිකරණය යි　　2 මහාධිකරණය යි

3 දිසා අධිකරණයයි　　4 මහේස්ත්‍රාත් අධිකරණය යි

19) ක්‍රි.ව 1977 පසු මෙරට කර්මාන්ත දියුණු කිරීම සඳහා අනුගමනයට කළ ප්‍රතිපත්ති නිසා ශීඝ්‍ර දියුණුවක් ඇති වූයේ කුමන කර්මාන්ත ක්ෂේත්‍රයක ද?

1 සිමෙන්ති - සීනි වැනි මහා පරිමාණ කර්මාන්ත　　2 ඇඟලුම් හා අපනයන ආශ්‍රිත කර්මාන්ත

3 සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත　　4 ආනයන ආදේශන කර්මාන්ත

20) මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ ප්‍රථම පියවර වශයෙන් ආරම්භ වන්නේ කුමන ව්‍යාපාරය ද?

1 මාදුරුඔය　　2 කොත්මලේ　　3 වික්ටෝරියා　　4 පොල්ගොල්ල

(ලකුණු 20 x 2 = 40 යි)



For Educational Purpose Only

SLGURU.LK

SLGURU.LK

## II කොටස

සැලකිය යුතුයි
- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- අනෙකුත් ප්‍රශ්න අතුරින් හතරක් තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

A



B



01) 1 - A රූපයෙන් දැක්වෙන ඇළ මාර්ගය නම් කරන්න.
2 - මෙය ඉදිකරන ලද්දේ කුමක ජාතිකයින්ද?
3 - ඔවුන්ගේ මවු රට කුමක්ද?
4 - මෙය කුමන කටයුත්තක් සඳහා භාවිතකර තිබේද?

ආ 1 - B රූපයෙන් දැක්වෙන පුද්ගලයා නම් කරන්න.
2 මෙතුමා කුමන ජාතිකයෙක්ද?
3 මෙතුමාගේ මූලිකත්වයෙන් ඇරඹි සමාගම කුමක්ද?
4 මෙතුමාගේ මූලිකත්වයෙන් ආරම්භ කළ පාසලක් නම් කරන්න.

(ලකුණු 2 x 8 = 16)

02) i බ්‍රිතාන්‍යයන්ගේ අවධානය ශ්‍රී ලංකාව කෙරෙහි යොමු වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii පහත තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් A,B,C,D අනුපිළිවෙළින් ලියන්න.
A - ක්‍රි.ව. 1762 උඩරට රජු හමුවීමට පැමිණි ඉංග්‍රීසි දූතයා
B - ශ්‍රී ලංකාවේ ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාර වරයා
C - ක්‍රි.ව. 1803 දී ඉංග්‍රීසින් විසින් උඩරට රජු ලෙස ප්‍රකාශයට පත්කළ කුමාරයා
D - වෙළෙඳ සමාගම මෙරට වෙරළබඩ ප්‍රදේශවල බදු අයකිරීමට ගෙන්වා ගත් මද්‍රාසි නිලධාරීන් (ලකුණු 04)

iii ක්‍රි.ව. 1803 ඉංග්‍රීසින් ගේ පළමු උඩරට ආක්‍රමණය අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

03) i පහත තොරතුරු වලට අදාල පිළිතුරු A,B අනුපිළිවෙළින් ලියන්න.
A - ක්‍රි.ව. 1818 නිදහස් සටන ආසන්නයේ වෙල්ලස්සේ මුහන්දිරම් තනතුරට පත් වූ පුද්ගලයා
B - ක්‍රි.ව. 1818 නිදහස් සටන ඇති වූ සමයේ උඩරට රජු හැටියට පෙනී සිටි පුද්ගලයා (ලකුණු 02)

ii ක්‍රි.ව. 1848 නිදහස් සටනට හේතු වූ නව බදු වර්ග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii ක්‍රි.ව. 1850 න් පසු මෙරට පාලනය කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු දේශීය කෘෂිකර්මාන්තය නගා සිටු වීමට ගත් ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

04) i මෙරට මිෂනාරි කටයුතු සාර්ථක වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii පහත තොරතුරු හා සම්බන්ධ පිළිතුරු A,B,C,D අනුපිළිවෙළින් ලියන්න
A - පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන පිහිටුවීමට මූලිකත්වය ගත් ස්වාමීන් වහන්සේ
B - කොළඹ තරුණ බෞද්ධ සංගමය පිහිටුවීමට පුරෝගාමී වූ පුද්ගලයා
C - මෙරට ඉස්ලාම් පුනරුද ව්‍යාපාරයට සහාය දුන් ඊජිප්තු ජාතිකයා
D - හින්දු දරුවන්ගේ අධ්‍යාපන උන්නතියට තම පුද්ගලික ධනය පරිත්‍යාග කොට පාසල් ආරම්භ කළ පුද්ගලයා (ලකුණු 04)



For Educational Purpose Only

SLGURU.LK

SLGURU.LK

iii පහත සඳහන් පුද්ගලයින් දෙදෙනෙකු පිළිබඳ කෙටි විස්තර ලියන්න.
1 මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
2 ටී. බී. ජයා මහතා
3 ආරුමුග නාවලර්තුමා
3 හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි (ලකුණු 05)

05) i පහත A හා B යටතේ සඳහන් කර ඇති තොරතුරු වලට අදාල පුද්ගලයින් නම් කරන්න.
A - ඉන්දියාවට පැමිණි පළමු පෘතුගීසි ජාතිකයා
B - ඉංග්‍රීසින් ඉන්දියාවට පැමිණෙන විට එහි සිටි මුගල් අධිරාජ්‍යයා (ලකුණු 02)
ii ඉන්දියානු ජාතික සංගමය තුළ සිටි මතවාදී කණ්ඩායම් දෙක නම් කොට, කණ්ඩායම් නියෝජනය කළ එක් නායකයෙකු බැගින් ලියන්න. (ලකුණු 04)
iii ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරය තුළ මහත්මා ගාන්ධිතුමාගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක කළ සටන් ව්‍යාපාර දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

06) i ලංකා ජාතික සංගමය පිහිටුවීමට එක් වූ කුඩා සංවිධාන දෙකක් ලියන්න (ලකුණු 02)
ii ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගින් පිහිටුවන ලද විධායක කාරක සභා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)
iii සෝල්බරි ප්‍රතිසංස්කරණ වල කැපී පෙනෙන ලක්ෂණ දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

07) i පහත තොරතුරු වලට අදාල පිළිතුරු ලියන්න.
A - නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැතිවරයා
B - ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනාධිපතිවරයා (ලකුණු 02)
(ලකුණු 02)
ii නිදහසෙන් පසු ශ්‍රී ලංකාවේ පහත වෙනස්කම් සිදුකළ රාජ්‍ය නායකයින් කවුරුන්දැයි A,B,C,D අනුපිළිවෙළින් ලියන්න.
A - සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කිරීම
B - එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය හිමි කර ගැනීම
C - 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව හඳුන්වා දීම
D - 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව හඳුන්වා දීම (ලකුණු 04)
iii නිදහසින් පසු ශ්‍රී ලංකාවේ වී ගොවිතැන දියුණු කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)



For Educational Purpose Only

SLGURU.LK